**ශීර්ෂය 272 - කුරුණෑගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

කුරුණෑගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශය 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව කුරුණෑගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 22 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 මැයි 22 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට කුරුණෑගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1) (ඇ) උප වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වාගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර, එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල

සමාලෝචනයක් සිදුකර ඒ අනුව පද්ධතිය ඵලදායී ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදුකරනු ලැබිය යුතුය.

**1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම**

-------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලැකිලිමත් විය යුතුය.

වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින්,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීමෙන් වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්වී ඇති බව,

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

---------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(ඇ) වගන්තිය හා 38 වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ඉකුත් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින්, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූපී වන බව ප්‍රකාශ කළ නොහැකි විය.

(ආ) කුරුණෑගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ඉකුත් වර්ෂයට අදාළව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින් මූල්‍ය ප්‍රකාශන පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කර නොතිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

---------------------------------------------

### 1.6.1 මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

---------------------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අයත් නිල නිවාස 54 ක වටිනාකම් තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි. | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් සියලු වත්කම් ගිණුම් ගත කළ යුතු බව. | නිල නිවාසවල වටිනාකම් තක්සේරුවට අවශ්‍ය ඉඩම් ඔප්පු සොයා ගැනීමේ ගැටලුව නිසා තක්සේරු කිරීමට නොහැකිවීම හේතුවෙන් වටිනාකම පමණක් ගිණුම්ගත කළ නොහැකි විය. |

### 1.6.2 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

--------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| නීති,රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | | |
| 2015 ජූලි 07 දිනැති අංක BD/GPS/ 130/9/ 14/MC-II දරන ජාතික අයවැය දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය | 2014 / 2015 අයවැය යෝජනා යටතේ යතුරු පැදි ලබාදුන් විශ්‍රාමික, සේවය අත්හිටවූ හා සේවයෙන් ඉවත්වූ ක්ෂේත්‍ර නිලධාරින්ගෙන් යතුරු පැදිවල වෙළඳපල වටිනාකම එකවර අයකර ගත යුතු වුවත්, කුරුණෑගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් ප්‍රාදේශිය ලේකම් කාර්යාල 09 ක ක්ෂේත්‍ර නිලධාරීන් 15 දෙනෙකුගෙන් රු.2,154,540 ක මුදලක් අයවීමට පැවතුණි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු බව. | එම නිලධාරීන් ලිඛිතව දැනුවත් කර ඇත. |

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) 2018 වර්ෂයේදී අමාත්‍යාංශ 07 කින් හා දෙපාර්තමේන්තු 03 කින් හා ජනාධිපති ලේකම් කාර්යාලයෙන් ලැබුණු රු.187,886,028 ක ප්‍රතිපාදන උපයෝජනය කර නොතිබුණි. එය ප්‍රතිශතයක් ලෙස සියයට 20 සිට සියයට 79 දක්වා පරාසයක විය. | ලැබී ඇති ප්‍රතිපාදන උපරිම ප්‍රයෝජනයට ගනිමින් සිදුකළ යුතු වැඩසටහන් නියමිත කාලයේදී ඉටුකළ යුතු බව. | අක් මුදල් නොමැති වීම සහ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට ප්‍රමාණවත් කාලයක් නොමැතිවීමෙන් මෙම ප්‍රතිපාදන ඉතිරි වී ඇත. |
| (ආ) 2018 වර්ෂයේදී අමාත්‍යාංශ 04 කින් ලබාදුන් එකතුව රු.25,643,094 ක ප්‍රතිපාදන අදාල කාර්ය ඉටු නොකිරීම නිසා සියයට 100 ක් ඉතිරි වී තිබුණු හෙයින් අපේක්ෂිත අරමුණු ඉටු වී නොතිබුණි. | ප්‍රතිපාදන ලබාදී ඇති කාර්ය වර්ෂය තුළ ඉටු කිරීමට කටයුතු කළ යුතු බව. | අයහපත් කාලගුණය හා ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට ප්‍රමාණවත් කාලයක් නොමැතිවීම නිසා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට නොහැකි වීමෙන් ප්‍රතිපාදන ඉතිරි වී ඇත. තවද කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයේ ප්‍රතිපාදන අවිච්ඡේද ප්‍රතිපාදන ලෙස නිවැරදිව ලබා නොදීම හා ජාතික ඒකාබද්ධතා හා සහජීවන අමාත්‍යාංශයෙන් 2018 දෙසැම්බර් 27 ප්‍රතිපාදන ලැබීම හා අක්මුදල් නොමැතිවීම මෙයට හේතුවී ඇත. |

**2.2** **තැන්පත් ශේෂයන්**

**----------------------**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වර්ෂ 02 කට වඩා කල් ඉකුත් වූ වටිනාකම රු.47,903,631 ක් වූ තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කළ යුතු බව | භාණ්ඩාගාරයෙන් ප්‍රමාණවත් අක් මුදල් නොලැබීමෙන් රැඳවුම් නිදහස් කිරීමට නොහැකි විය. මේ වන විට ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල 2017 වර්ෂය දක්වා වූ කල් ඉකුත් වූ තැන්පතු නිදහස් කර ඇත. |

**3.** **මෙහෙයුම් සමාලෝචනය**

**-----------------------------**

**3.1** **අපේක්ෂිත ප්‍රතිලාභ (Outcome) ලබා නොගැනීම**

**-------------------------------------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) සමෘද්ධිලාභීන් සවිබල ගැන්වීමේ ව්‍යාපෘතිය යටතේ කොබෙයිගනේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ 2014 2015, 2016 හා 2017 වර්ෂවල ක්‍රියාත්මක කරන ලද රජයේ දායකත්වය රු.324,824 ක්වූ ව්‍යාපෘති 23 ක් අසාර්ථක තත්ත්වයේ පැවතුණි. | ව්‍යාපෘති ක්‍රියාත්මක කළ පසු ඒවා සම්බන්ධයෙන් පසු විපරම් කිරීම් සිදුකර සාර්ථක තත්ත්වයට පත් කිරීමට කටයුතු කළ යුතු බව. | අසාර්ථක ව්‍යාපෘති යලි සාර්ථක තත්ත්වයට පත් කිරීමට කටයුතු කරමින් සිටී. |
| (ආ) 2016 හා 2017 වර්ෂවලදී ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධන වැඩසටහන යටතේ රු.2,979,800 ක වියදමින් ගනේවත්ත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ දිවුල්වැව හා කැකුලාවල ළිඳ ප්‍රතිසංස්කරණය, ජල ගබඩා ටැංකිය ඉදිකිරීම, ළිඳ වටා වැට ඉදිකිරීම හා පොම්පාගාරය වයරිං කිරීම යන වැඩ කොටස් ඉටුකර තිබුණි. එහෙත් මෙම ව්‍යාපෘතියේ ඉතිරි වැඩ නිම කිරීමට අවශ්‍ය වතුර මෝටර් 02 ක් හා ජලනල | ව්‍යාපෘති සඳහා රජයේ මුදල් වැය කිරීමේදී උපරිම ඵලදායීතාව ජනතාවට ලැබෙන පරිදි කටයුතු කළ යුතු බව. | මේ වන විට අවශ්‍ය උපකරණ කොටසක් මිලදීගෙන ඇත. ඉදිරි ප්‍රතිපාදන මඟින් අරමුණ ඉටුකරගැනීමට බලාපොරොත්තු වේ. |

| | | | |
|---|---|---|---|
| | සඳහා අවශ්‍ය රු.3,141,715 ක ප්‍රතිපාදන නොමැතිවීමෙන් ව්‍යාපෘතිය අපේක්ෂිත අරමුණු ඉටු වී නොතිබුණි. | | |
| (ඈ) | දැයට කිරුළ අවිච්ඡේද ව්‍යාපෘති යටතේ රු.50,262,908 ක් වැයකර ඉබ්බාගමුව නගර ශාලාවේ ඉදිකිරීම් කටයුතු 2017 වර්ෂයේදී නිමකර ජනතා අයිතියට පත් කර තිබුණද, 2019 අප්‍රේල් 30 දින වන විටද ප්‍රයෝජනයට නොගෙන නිෂ්කාර්යව පැවතුණි. | රජයේ මුදල් වැයකර ව්‍යාපෘති නිමවා ඒවා ප්‍රයෝජනයට ගෙන ව්‍යාපෘතියෙන් අපේක්ෂිත අරමුණු ළඟා කර ගත යුතු බව. | නගර ශාලාව ප්‍රාදේශීය සභාව වෙත පැවරීම සඳහා 2019 අප්‍රේල් 03 දිනැති ලිපිය මඟින් අමාත්‍යාංශ උපදෙස් ඉල්ලා ඇත. |
| (ඇ) | දැයට කිරුළ සංවර්ධන වැඩසටහන යටතේ මාවතගම සතිපොල සඳහා එකතුව රු.50,391,654 ක මුදලක් වියදම් කර වැඩ නිම කර තිබුණද, 2019 අප්‍රේල් 30 දින වන විටත් නිෂ්කාර්යව පැවතුණි. | රජයේ මුදල් වැයකර ව්‍යාපෘති නිමවා ඒවා ප්‍රයෝජනයට ගෙන ව්‍යාපෘතියෙන් අපේක්ෂිත අරමුණු ළඟා කර ගත යුතු බව. | 2017 මූල්‍ය වර්ෂය අවසානයේදී අවිච්ඡේද ප්‍රතිපාදන නොමැති බව දැනුවත් කර ඉතිරි වැඩ සිදුකර ගත යුතු බව දන්වා ව්‍යාපෘතියේ වැඩ අවසන් කර 2018 මාර්තු මස ප්‍රාදේශීය සභාවට භාර දී ඇත. මේ වන විට පැවති වැඩ අවසන් කර සතිපොල වෙළඳාම් කටයුතු සහ භාවිතයට ගෙන ඇත. |
| (ඉ) | දැයට කිරුළ සංවර්ධන වැඩසටහන යටතේ ඉබ්බාගමුව සතිපොලෙහි විදුලි වැඩ නිම කිරීම සඳහා රු.1,223,600 ක මුදලකට ගිවිසුම් ගතව තිබුණද, එකී වැඩ ඉටු කර නොතිබුණි. එසේම 2017 හා ඊට පෙර වර්ෂවලදී රු.30,980,822 ක් වැයකර ඉදිකළ ඉබ්බාගමුව සති පොලෙහි පිවිසුම් මාර්ගය වර්ෂා කාලයේදී වැසි ජලයෙන් යටවීම, වාහන නවතා තැබීමට ඉඩ නොමැති වීම, සියලු වෙළෙඳුන්ට ඉඩ ප්‍රමාණවත් නොවීම යන අඩුපාඩු නිරීක්ෂණය වූ අතර, කිසිදු ප්‍රයෝජනයට නොගෙන නිෂ්කාර්යව පැවතීමෙන් අපේක්ෂිත අරමුණු ඉටුවී නොතිබුණි. | රජයේ මුදල් වැයකර ව්‍යාපෘති නිමවා ඒවා ප්‍රයෝජනයට ගෙන ව්‍යාපෘතියෙන් අපේක්ෂිත අරමුණු ළඟා කර ගත යුතු බව. | අදාල සැලසුම් ප්‍රකාරව ඉදිකිරීම් සිදුකර ඇත. පිවිසුම් මාර්ග නිර්මාණය සහ වාහන නැවැත්වීමේ පහසුකම් ඇති කිරීම ආදී යටිතල පහසුකම් සංවර්ධනය ප්‍රාදේශීය සභාව සතු කාර්යයකි. |

| | | | |
|---|---|---|---|
| (ඊ) | කෘෂිකර්ම අමාත්‍යාංශ ප්‍රතිපාදන යටතේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ පළතුරු පර්යේෂණ හා සංවර්ධන ආයතනයේ මෙහෙයවීමෙන් දිස්ත්‍රික් ලේකම් හරහා සිදුකර තිබූ පළතුරු නිෂ්පාදන පොකුරු ව්‍යවසායකත්ව ආදර්ශ ව්‍යාපෘතිය යටතේ මහව ප්‍රදේශයේ අක්කර 50 ක වපසරියක වගා කිරීමට ලබාදුන් රු.මිලියන 03 ක් වටිනා කැවෙන්ඩිස් කෙසෙල් පැල 37,500 න් පැල 3,350 ක් නිසි ප්‍රමිතියෙන් තොර වීම නිසා විනාශ වී තිබුණි. රු.මිලියන 4.8 ක ප්‍රතිපාදනයෙන් කැවෙන්ඩිස් කෙසෙල් වගාවට ජල අවශ්‍යතාවය ලබාදීමට යෝජිතව තිබුණද විසුරුම් ජල පද්ධතිය ලබා නොදීම හේතුවෙන් රු.මිලියන 1.18 ක් වටිනා පැල 11,800 ක් ක්ෂේත්‍රයේ සිටුවා නොතිබුණි. බිම් සැකසීම හා වෙනත් කටයුතු වෙනුවෙන් ගොවීන් 09 දෙනෙකු විසින් රු.මිලියන 5.70 ක වියදමක් දරා තිබුණු නමුත් වගාවට අවශ්‍ය ජල අවශ්‍යතා සපුරා ගැනිමට නොහැකි වීමෙන් වගාව පැවතිය යුතු අවම වර්ධන මට්ටමවත් ලබා නොතිබුණි. අස්වනු නෙලූ පසු මිලදී ගැනීම සඳහා සුදුසු වෙළඳපලක් හෝ පුද්ගලයෙක් හෝ ආයතනයක් සමඟ ගිවිසුම් ගතවී නොතිබීමෙන් අපේක්ෂිත අරමුණ ඉටුකර ගැනීමේ ගැටලුවක් පැවතුණි. | ප්‍රථමයෙන් ඉටුකළ යුතු වැඩ කොටස් කලින් ඉටු කර අපේක්ෂිත අරමුණු ළඟා කර ගැනීම සඳහා කටයුතු කළ යුතු බව. | CIC සමාගම විසින් සපයා දෙන ලද සියලු කෙසෙල් පැල නිරෝගී තත්ත්වයේ පැවතුණ බව අවධාරණය කරමි. මෙම කාල වකවානුවේ පැවති දැඩි නියං තත්ත්වය අධික උෂ්ණාධික තත්ත්වය පැල මියයාමට හේතුවී ඇතැයි නිගමනය කළ හැක. ගොවීන්ට පාංශු ජලය සංරක්ෂණය සිදුකළ යුතු බවට කෘෂිකර්ම දෙපාර්තමේන්තු නිලධාරින් උපදෙස් දී තිබුණද, ගොවීන් බොහොමයක් ඒ සඳහා ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. වඳ පීදුනු පැල නොතිබුණ අතර, පැල වර්ධනය වීමත් සමඟ එම ලක්ෂණ මහහැරී යයි. CIC ආයතනය විසින් සපයන ලද පැල (පිරිවිතරයට අනුව අගල් 8 -24 අතර පත්‍ර 4-5 සහිත පැල) පිරිවිතරයට අනුව නොතිබුණද, සපයන ලද පැල අහල් 4-6 ත් පමණ උස හා පත්‍ර 3-4 ක් වර්ධනය වී තිබුණි. මාගේ දැනුමට අනුව මෙම ප්‍රමාණයේ කෙසෙල් පැලද සුදුසු පරිසර තත්වය යටතේ වගා කිරීමෙන් මනා කෙසෙල් වගාවක් පවත්වා ගත හැකිය. අසාර්ථක පැල ප්‍රමාණය සියයට 8.9 කි. එයට කාලගුණ හා දේශගුණ තත්ත්වය හේතුවන්නට ඇත. ප්‍රතිපාදන ප්‍රමාද වී ලැබීම ලැබුණ ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම නිසා ව්‍යාපෘතිය ක්‍රියාත්මක කළ යුතු ක්‍රමවේදයන් හා ඊට අදාල පිරිවිතරයන් සම්බන්ධව තිබුණු අවිනිශ්චිතතාවයන් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක නොවීමට හේතු විය. |

**3.2 වෙනත් නිරීක්ෂණ**

**--------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ගනේවත්ත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ සීරාදුන්න ග්‍රාම නිලධාරී වසමේ ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධන වැඩසටහන යටතේ ආරම්භ කරන ලද වේදෙනියගම ජල ව්‍යාපෘතිය සඳහා 2016 වර්ෂයේදී රු.497,500 ක වියදමෙන් ජල ටැංකිය පමණක් ඉදිකර තිබූ අතර, වතුර මෝටර්, පොම්පාගාරය, ජලනල පද්ධතිය ඉදිකර නොතිබීමෙන් ඉදිකරන ලද ජල ටැංකිය නිෂ්කාර්යව පැවතුණි. | ව්‍යාපෘති ආරම්භ කිරීමේදී එහි ප්‍රතිඵල ලබා ගත හැකි පරිදි අවශ්‍ය ප්‍රතිපාදන ලබාගෙන ව්‍යාපෘතිය සම්පූර්ණ කිරීමට කටයුතු කළ යුතු බව. | 2018 වර්ෂයේ ගම්පෙරලිය වැඩසටහන යටතට යෝජනාවක් ලෙස අනුමත කර ඇත. |
| (ආ) | උඩුබද්දාව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය සභාව විසින් එකඟතාවයකට නොපැමිණීම හේතුවෙන් 2018 වසරේ ග්‍රාමීය ක්‍රීඩා පිටි සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය යටතේ උඩුබද්දාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ක්‍රීඩා පිටි 02 ක් ඉදිකිරීම සඳහා ලබාදී තිබූ රු.2,151,523 ක ප්‍රතිපාදන අවලංගු කර තිබුණි. | ප්‍රදේශයට ප්‍රතිලාභ ලබා ගැනීමට හැකි වන සේ ලැබෙන ප්‍රතිපාදනවලින් උපරිම ප්‍රයෝජන ලබා ගැනීමට කටයුතු කළ යුතු බව. | මේ සඳහා විවෘත ප්‍රසම්පාදන ක්‍රමය අනුගමනය කිරීමට කාලය ප්‍රමාණවත් නොවීම හා ප්‍රාදේශීය සභාවේ එකඟතාවය කිසිදු අවස්ථාවක නොලැබීම නිසා ව්‍යාපෘතිය සංශෝධනයට ඉදිරිපත් කරන ලදී. |

**3.3 වත්කම් කළමනාකරණය**

**---------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | මල්ලවපිටිය, කොටවෙහෙර ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අයත් ග්‍රාම සේවා වසම් 18 ක එකතුව අක්කර 16 රූඩ් 3 ක ඉඩම සහ එම භූමියේ පිහිටි ගොඩනැගිලි 13 ක් නිෂ්කාර්යව පැවතුණි. | රජයේ දේපළ නිෂ්කාර්යව නොතබා භාවිතා කිරීමට පියවර ගත යුතු බව. | මෙම ගොඩනැගිලි දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් නොවන බැවින් විගණන විමසුමේ පෙන්වා දුන් කරුණු එම ආයතන වෙත දැනුවත් කර ඇත. |
| (ආ) | මල්ලවපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් බහු කාර්ය ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා 2011, 2012 හා 2014 වර්ෂවල එකතුව රු.2,931,038 ක වියදමක් දරා තිබුණද, සම්පූර්ණයෙන් වැඩ නිම කිරීමට නොහැකි වීමෙන් ඌන උපයෝජිතව පැවතුණි. | රජයේ දේපළ සම්පූර්ණයෙන් භාවිතයට ගැනීමට පියවර ගත යුතු බව. | මෙහි ඉතිරි වැඩ නිම කිරීමට මුදල් ඉල්ලුම් කර ඇත. දැනට වැඩ අවසන් කොටසේ ග්‍රාම නිලධාරී, සංවර්ධන නිලධාරී, සමෘද්ධි නිලධාරී කාර්යාල පවත්වාගෙන යයි. |
| (ඇ) | පොල්පිතිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ආපදා කළමනාකරණ අමාත්‍යාංශයෙන් 2015 වර්ෂයේදී ලද ප්‍රතිපාදන මත පොතුවිල ග්‍රාම නිලධාරී වසමේ රු.462,638 ක වියදමින් ඉදිකර තිබූ පානීය ළිඳ වටේට පස්පුරවා තදකර නොතිබුණ හෙයින්, වළලු ඇදවී තිබුණි. මෙම ළිඳ ඉදිකළ අවස්ථාවේ සිට ප්‍රයෝජනයට ගෙන නොතිබුණි. | ව්‍යාපෘති නිසි ප්‍රමිතියෙන් ඉටුකර ඇති බවට ගෙවීම් කිරීමට පෙර තහවුරු කර ගත යුතු මෙන්ම ශක්‍යතා අධ්‍යනයක් සිදුකර අවශ්‍ය ව්‍යාපෘතිවල ආරම්භ කළ යුතු බව. | මෙම පානීය ළිඳෙහි පවතින අඩුපාඩු හේතුවෙන් පානීය ළිඳක් වශයෙන් භාවිතයට ගැනීම නුසුදුසු වන අතර, එම අඩුපාඩු සකස් කර දෙන ලෙස ගොවි සංවිධාන දැනුවත් කර ඇත. එතෙක් රැඳවුම් ගෙවීම අත්හිටුවා ඇත. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | පොල්පිතිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ සමෘද්ධි ප්‍රතිලාභීන්ගේ නිෂ්පාදන ගබඩා කිරීම හා සකස් කිරීම සඳහා අවශ්‍ය පහසුකම් හා එම නිෂ්පාදන අලෙවි කිරීමේ අරමුණින් රු.300,000 ක වියදමකින් 2017 වර්ෂයේ ඉදිකළ අලෙවි කුටිය සඳහා අවශ්‍ය උපකරණ නොලැබීම නිසා 2018 දෙසැම්බර් 31 දින වන විටත් අපේක්ෂිත අරමුණ ඉටු නොවී නිෂ්කාර්යව පැවතුණි. | ව්‍යාපෘති ආරම්භ කිරීමේදී ඉදිරි කටයුතු සම්පූර්ණ කර ගැනීමට ප්‍රතිපාදන ලබා ගැනීම පිළිබඳවද සැලකිලිමත් විය යුතු බව. | අලෙවි කටයුතු සඳහා සුදුසු පරිදි එහි අවශ්‍යතා සම්පූර්ණ වන තෙක් ප්‍රදේශයේ සමෘද්ධි ලාභීන්ගේ නිෂ්පාදන අලෙවි කරගැනීමේ මධ්‍යස්ථානයක් ලෙස භාවිතා කිරීමට අවශ්‍ය පියවර ගන්නා බව ප්‍රාදේශීය ලේකම් විසින් දන්වා ඇත. |
| (ඉ) | උඩුබද්දාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් මඩවලාගාරය මැටි ඇඹරීමේ යන්ත්‍රය වසර 05 කට පෙර ලබාදී තිබූ මුත් එම භූමිය රජයට පවරාගෙන නොමැතිවීම හේතුවෙන් අවශ්‍ය විදුලිබල සැපයුම ලබාගැනීමට නොහැකිවීමෙන් මෙම යන්ත්‍රය නිෂ්ක්‍රීයව තිබුණි. | ඉදිකිරීම් ආරම්භ කිරීමට පෙර භූමිය රජයට පවරා ගැනිමට කටයුතු කළ යුතු බව. | ග්‍රාම ශක්ති වැඩසටහනේ ජීවනෝපාය සංවර්ධනයට වෙන් වී ඇති මුදලින් විදුලිය ලබාදීමට සැලසුම් කර ඇත. විදුලිබිල ගෙවීමේ වගකීම මෙය ප්‍රයෝජනයට ගන්නා කණ්ඩායමට පැවරීමට සැලසුම් කර ඇත. |
| (ඊ) | වෙන්දේසි කිරීමට යෝජිත වාහන 25 ක් 2019 අප්‍රේල් 30 දින වන විටත් අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි. | ප්‍රමාදයකින් තොරව මෙම වාහන අපහරණය කිරීමට කටයුතු කළ යුතු බව. | 2019 මැයි 02 දක්වා වාහන අපහරණය සඳහා අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය ලැබී නැත. වාහන අපහරණය සම්බන්ධයෙන් මූලික කටයුතු සියල්ල අවසන් කර ඇති අතර, අපහරණය සඳහා නැවත වතාවක් අනුමැතිය ඉල්ලා 2019 මැයි 02 දින ලිපිය අමාත්‍යාංශයට යොමු කර ඇත. |

## 3.4 අනාර්ථික ගනුදෙනු

---------------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මල්ලවපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් මොහොත්තව ගංඋරුලැව පානීය ජල යෝජනා ක්‍රමය සඳහා 2015/2016 වර්ෂවලදී එකතුව රු.783,245 ක වියදමක් දරා නළ ළිඳ ඉදිකර තිබුණද, ජල ගබඩා ටැංකිය ඉදිකිරීම, බෙදුම් නල එළීම, තෙකලා විදුලිය ලබා ගැනීම, ජල පොම්ප ලබා ගැනීම හා සවි කිරීම සිදු නොකිරීම නිසා ව්‍යාපෘතියේ අපේක්ෂිත අරමුණ ඉටු වී නොතිබුණි. | ව්‍යාපෘති ආරම්භ කිරීමට පෙර ව්‍යාපෘතිය සම්පූර්ණයෙන් නිම කිරීමට ප්‍රතිපාදන ලබාගත හැකි ආකාරය පිළිබඳ සැලකිලිමත් විය යුතු බව. | මෙම ව්‍යාපෘතිය සඳහා 2016/2017 හා 2018 වර්ෂවල ඉල්ලීම් කළද ප්‍රතිපාදන වෙන් නොවීය. |

## 3.5 කළමනාකරණ දුර්වලතා

---------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සේවය හැරගොස් වසර 01 - 05 කට වැඩි කාල පරිච්ඡේදයක් ගත වී තිබුණද, 2018 දෙසැම්බර් 31 දිනටත් නිරවුල් නොවූ එකතුව රු.677,225 ක් වූ ණය ශේෂ 06 ක් පැවතුණි. | අයකර ගැනීමට අවශ්‍ය කටයුතු කළ යුතු බව. | ඇපකරුවන්ගෙන් අයකර ගැනීමට හැකි ණය ඔවුන්ගෙන් අයකර ගැනීමට හා එසේ නොමැති නම් නීතිපති උපදෙස් පරිදි අයකර ගැනීමට කටයුතු කරමින් පවතී. |
| (ආ) | ප්‍රාදේශීය ලේකම් කාර්යාල 02 ක මියගිය නිලධාරීන් දෙදෙනෙකු විසින් ගෙවීමට ඇති රු.308,940 ක මුදල 2018 දෙසැම්බර් 31 දින විටත් අය නොවී පැවතුණි. | අයකර ගැනීමට අවශ්‍ය කටයුතු කළ යුතු බව. | නීති උපදෙස් ඉල්ලා ඇත. එක් ශේෂයක් මරණ පාරිතෝෂිකයෙන් අයකර ගැනීමට නියමිතය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ප්‍රාදේශීය ලේකම් කාර්යාල 02 ක විශ්‍රාම ගිය නිලධාරීන් 02 දෙනෙකුගෙන් එකතුව රු.298,518 ක ණය ශේෂයක් 2018 දෙසැම්බර් 31 දින වන විට අයකර ගැනීමට පැවතුණි. | අයකර ගැනීමට අවශ්‍ය කටයුතු කළ යුතු බව. | විශ්‍රාම පාරිතෝෂිකයෙන් අයකර ගැනීමට නියමිතව ඇත. |
| (ඈ) | වැඩ තහනම් කර ඇති නිලධාරීන් 05 දෙනෙකුගෙන් අයවිය යුතු එකතුව රු.319,679 ක ණය ශේෂය 2018 දෙසැම්බර් 31 දින වන විටත් අය කරගෙන නොතිබුණි. මෙම ණය ශේෂ වසර 01 ත් 18 ත් අතර කාල පරාසයක පැවතුණි. | අයකර ගැනීමට අවශ්‍ය කටයුතු කළ යුතු බව. | නීතිපති උපදෙස් ලබා ගැනීමට කටයුතු කර ඇත. ඇපකරුවන්ගෙන් අයකර ගැනීම සඳහා නිලධාරීන් දැනුවත් කර ඇත. |
| (ඉ) | 2018 වර්ෂයේ කුරුණෑගල දිස්ත්‍රික්කය තුළ වන අලි ප්‍රහාරවලින් සිදුවූ දේපළ ශරීර හා ජීවිත හානි 70 ක් සඳහා එකතුව රු.3,923,795 ක්වූ වන්දි මුදල් ප්‍රමාණයක් පිරිනමා තිබුණත්, වන්දි ගෙවීම සඳහා හානිය සිදුවූ දින සිට මාස 06 ත් අවුරුදු 01 මාස 11 ත් අතර කාලයක් ගත වී තිබුණි. වන්දි ගෙවීමේ ක්‍රමවේදය සඳහා විශාල කාලපරිච්ඡේදයක් ගතවන බැවින් හානියට පත් වූවන් සඳහා වන්දි ලබාදීමෙන් අපේක්ෂිත රජයේ අරමුණ ඉටු වීම පහළ මට්ටමක පැවතුණි. | හැකි ඉක්මනින් වන්දි ලබාදී විපතට පත්වූවන්නට සහන සැලසීමට කටයුතු කළ යුතු බව. | වන්දි කමිටුව වෙත අසම්පූර්ණ අයදුම් පත්‍රය ඉදිරිපත්වීමෙන් එම අඩුපාඩු සම්පූර්ණ කිරීමට ආපසු යැවීමට සිදුවීමෙන් ප්‍රමාදයන් සිදුවේ. |
| (ඊ) | කොටවෙහෙර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පිහිටි කුඹුරු අක්කර 50 ක් අස්වැද්දීමට ජලය සපයන වැව් 04 ක් 2018 මැයි මස පැවති අධික වර්ෂාව නිසා විනාශයට පත්වී තිබුණද, එම වැව් පිළිසකර කිරීමට අවශ්‍ය පියවර ගෙන නොතිබුණි. | කැඩුණු වැව් යථා තත්ත්වයට පත්කර ගැනිමට අවශ්‍ය පියවර ගැනීම සඳහා ගොවිජන සේවා දෙපාර්තමේන්තුව දැනුවත් කළ යුතු බව ඒ සම්බන්ධ පසු විපරම් කළ යුතු බව. | මේ සම්බන්ධයෙන් ගොවිජන සේවා දෙපාර්තමේන්තුව දිස්ත්‍රික් ලේකම් දැනුවත් කළද ප්‍රතිපාදන නොලැබුණි. |

| | | | |
|---|---|---|---|
| (උ) | කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය විසින් කුරුණෑගල දිස්ත්‍රික්කයේ තෝරාගත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 10 ක මධ්‍යස්ථාන 10 ක කුඩාකර්මාන්ත ඇඟලුම් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට රු.122,264,445 ක් වටිනා යන්ත්‍ර හා උපකරණ ලබාදී තිබුණි. මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් 2017 හා 2018 වර්ෂවල මෙහෙයුම් වියදම් ලෙස රු.3,776,180 ක්ද වැයකර තිබුණි.<br><br>මේ සම්බන්ධව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.<br><br>(i) දිස්ත්‍රික් ලේකම් විසින් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් තෝරාගත් ස්ථාන හා පුද්ගලයින් පිළිබඳ විස්තර කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ වෙත යොමු කළද ඊට වෙනස් ස්ථාන හා පුද්ගලයින් කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයේ ලේකම් විසින් තෝරා එවා තිබීමෙන් රු.138,290 ක අතිරේක විදුලි වියදම් දැරීමට සිදුවීමත් පුහුණු කටයුතු ආරම්භ කිරීම් ප්‍රමාදයනුත් සිදුවී තිබුණි.<br><br>(ii) මාස 06 ක පුහුණුවෙන් පසු ස්වශක්තියෙන්ම කර්මාන්ත ශාලා ලෙස පවත්වාගෙන යාමට යෝජනා කර තිබුණත් විගණන දිනය වූ 2019 පෙබරවාරි 26 දින වන විට පොල්ගහවෙල, කුරුණෑගල, පඩුවස්නුවර (බටහිර), මහව, රිදීගම හා උඩුබද්දාව ඇඟලුම් කර්මාන්ත ශාලා වසා දමා මැෂින් අක්‍රීයව පැවතුණි. | ව්‍යාපෘතියේ අපේක්ෂිත අරමුණු ළඟාකර ගැනීම සඳහාත් වැයකළ මුදලින් උපරිම ප්‍රතිලාභ ළඟා කරගත හැකිවන පරිදි දැනට අසාර්ථක ව්‍යාපෘති සාර්ථක කර ගැනීමට කටයුතු කළ යුතු බව සහ රජයේ වත්කම් විවිධ පාර්ශවයන්ට භාරදීමේදීත් ව්‍යාපාර ආරම්භ කර පවත්වාගෙන යාමේදීත් ඒවා නීත්‍යානුකූල ආකාරයකින් සිදුකළ යුතු බව. | මෙම ව්‍යාපෘතියට අදාල පුහුණු මධ්‍යස්ථාන 10 න් 08 ක් ලියාපදිංචියට අදාල ලිපි ලේඛන සකස් කර යොමුකර ඇත. දැනට මධ්‍යස්ථාන 07 ක වැඩ කටයුතු සාර්ථකව සිදුවන බවද ඉන් මධ්‍යස්ථාන 05 ක් ව්‍යාපාර වශයෙන් විධිමත්ව ඇනවුම් ලබාගෙන ක්‍රියාත්මක වේ. |
| (ඌ) | 2018 දෙසැම්බර් 31 දින වන විට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 14 ක් | භාණ්ඩ හා සේවා සපයා ගැනීමෙන් පසු චෙක්පත් භාරදිය යුතු | වර්ෂ අවසානයේ සංවර්ධන ව්‍යාපෘතිවල පරිපාලන වියදම්වලින් |

| | | |
|---|---|---|
| විසින් ලියා ඇති නමුත් 2019 ජනවාරි 21 වන විටත් අදාල පාර්ශවයන්ට භාරදී නොමැති වටිනාකම රු.15,291,872 ක් වූ චෙක්පත් 127 ක් විය. | බව. | මිලදි ගැනීම් සිදුකිරීම නිසා සැපයීම්වල සුළු ප්‍රමාදයක් ඇත. මේ වන විට මිලදී ගත් භාණ්ඩ නියමිත පරිදි ලබාගෙන චෙක්පත් නිදහස් කර ඇත. |

**4. තිරසර සංවර්ධන අරමුණු ළගා කර ගැනීම**

---

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| <u>විගණන නිරීක්ෂණය</u> | <u>නිර්දේශය</u> | <u>ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම</u> |
|---|---|---|
| (අ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් හඳුනාගත් තිරසර සංවර්ධන අරමුණුවලට අදාල ඉලක්ක 2019 අප්‍රේල් 30 දින වන විටද සකස් කර නොතිබුණි. | තිරසර අරමුණුවලට අදාල ඉලක්ක හඳුනාගෙන ඒවා ළඟා කර ගැනීමට කටයුතු කළ යුතු බව. | 2019 වර්ෂය සඳහා ඉතා කඩිනමින් ඉලක්ක සකස් කොට අවසන් කිරීමට සැලසුම් කර ඇත. |
| (ආ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් හඳුනාගෙන ඇති තිරසර සංවර්ධන අරමුණු හා ඒ අනුව සකස් කළ ඉලක්ක ආයතනයේ ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර නොතිබුණි. | තිරසර අරමුණු හා ඉලක්ක ආයතනයේ ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කළ යුතු බව. | දැනටමත් 2019 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර ඇති අතර තිරසර සංවර්ධන අරමුණු වලට අදාල ඉලක්ක හඳුනා ගෙන අවසන් වූ පසු එම ක්‍රියාකාරී සැලැස්මට ඇතුලත්කොට සංශෝධනය කිරීමට බලාපොරොත්තු වෙමි. |
| (ඇ) තිරසර සංවර්ධන ඉලක්ක කරා ළඟාවීමේදී අදාල කාර්යයන් නියාමනය කිරීම සඳහා අවශ්‍ය සංධිස්ථානයන් හඳුනාගෙන නොතිබුණි. | තිරසර සංවර්ධන ඉලක්ක කරා ළඟාවීම සඳහා අදාල කාර්යයන් නියාමනය කිරීම සඳහා අවශ්‍ය සංධිස්ථානයක් හඳුනාගත යුතු බව. | තිරසර සංවර්ධනයේ අරමුණු ලඟා කර ගැනීමේ කාර්යයන් නියාමනය කිරීම සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ක්‍රම සම්පාදන අංශය විසින් කටයුතු කරනු ඇත. |

**5. යහපාලනය**

**5.1 මහජනයා වෙත සේවා ඉටු කිරිම**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරික්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| කුරුණෑගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල වෙබ් අඩවි මහජන පැමිණිලි භාරගත හැකි ආකාරයෙන් සකස් කර නොතිබුණි. | වෙබ් අඩවි මහජන පැමිණිලි භාරගත හැකි ආකාරයට සකස් කළ යුතු බව. | වෙබ් අඩවියේ පවතින තාක්ෂණ දෝෂයක් නිසා මෙතෙක් මහජන පැමිණිලි භාරගත නොහැකි වී ඇත. |

**6. මානව සම්පත් කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරික්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල 2018 වර්ෂය අවසාන වන විට මුළු පුරප්පාඩු සංඛ්‍යාව 219 ක් වූ අතර, ඉන් 21 ක් ප්‍රාථමික මට්ටමේද, 166 ක් ද්විතියික මට්ටමේද, 28 ක් තෘතියික මට්ටමේද, 04 ක් ජ්‍යෙෂ්ඨ මට්ටමේද විය. | පුරප්පාඩු සම්පූර්ණ කළ යුතු බව. | පුරප්පාඩු සම්බන්ධයෙන් අමාත්‍යාංශ ලේකම් දැනුවත් කර ඇත. |